# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 258/18 — 1977 අප්‍රේල් 01 වැනි සිකුරාද — 1977.04.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## (I) වැනි කොටස: (I) වෙනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

බී 4/77

**ළමයින් දරුකමට හද ගැනීමේ ආඥපනත**

61 වන අධිකාරය

ළමයින් දරුකමට හද ගැනීමේ ආඥ පනතේ 16 ආ වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ටී. බී. ඉලංගරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍ය.

1977 මාර්තු මස 31 වන දින,
කොළඹ දී ය.

**නියෝග**

(1) මේ නියෝග ළමයින් දරුකමට හද ගැනීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) දරුකමට හදගත් ළමයාගේ නම, ඒ ළමයා දරුකමට හදගැනීම කරන්නාගේ හෝ දරුකමට හදගැනීම කරන්නන්ගේ නම හෝ නම් පිළිබඳව දරුකමට හද ගැනීමේ ලේඛනයෙහි ඇති විස්තර වෙනස් කිරීමට විධාන කරන නියමයක් සඳහා (මෙහි මින්මතු ''ආඥ පනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) ළමයින් දරුකමට හද ගැනීමේ ආඥ පනතේ 10(5) (අ) වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත කරනු ලබන සෑම ලිඛිත ඉල්ලීමක්ම මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති ''අ'' ආකෘතිය අනුව විය යුතුය.

(3) දරුකමට හදගැනීමේ ලේඛනයෙහි ඇති සටහනක සිද්ධි පිළිබඳව වූ හෝ සාරාර්ථය පිළිබඳව වූ විස්තර කිසිවක යම් දෝෂයක් නිවරද කිරීම සඳහා ආඥපනතේ 10(5) (ඇ) වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත කරනු ලබන සෑම ලිඛිත ප්‍රකාශනයක් ම මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති ''ආ'' ආකෘතිය අනුව විය යුතුය.

(4) හදගත් ළමයකුගේ උප්පැන්නය නැවත ලියාපදිංචි කරවා ගැනීම සඳහා ආඥපනතේ 10 ආ (1) වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත කරනු ලබන සෑම ලිඛිත ප්‍රකාශනයක් ම මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති ''ඇ'' ආකෘතිය අනුව විය යුතුය.

(5) මෙහි වූ උපලේඛනයෙහි ''ඇ'' ආකෘතිය අනුව ප්‍රකාශනය කරන අඹුසැමියන් ඒ ප්‍රකාශනය කරනු ලැබුවේ යම් ළමයකු දරුකමට හද ගැනීම සම්බන්ධයෙන් ද ඒ ළමයා දරුකමට හද ගැනීමට අධිකරණයක් විසින් බලය දී ඇති බවට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, සෑහීමට පත් වූ අවස්ථාවක, ඔහු විසින්, මෙහි වූ උපලේඛනයෙහි ''ඇ'' ආකෘතියෙහි දක්වා ඇති කරුණු පිළිබඳව අදළ විස්තර ඇතුළත් කිරීමෙන් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ උප්පැන්න ලියාපදිංචි කිරීම සඳහා සලසා ඇති ලේඛනයෙහි ඒ ළමයාගේ උප්පැන්නය නැවත ලියාපදිංචි කිරීමට ඒ ළමයාගේ උත්පත්තිය සිදු වූ කොට්ඨාශයේ රෙජිස්ට්‍රාර්වරයාට විධාන කරනු ලැබිය යුතු අතර ළමයකුගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමට අදළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ සියලුම විධිවිධාන, මේ ආඥ පණත යටතේ දරුකමට හදගත් ළමයකුගේ උප්පැන්නයක් නැවත ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදළ වන්නේය.

1 A—ජී 26568—6,265 (77/04)

(6) දරුකමට හදාගත් ළමයකුගේ උප්පැන්නය මේ ආඥාපනතේ විධිවිධාන යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක දරුකමට හදා ගැනීමේ ලේඛනයෙහි ඒ ළමයා සම්බන්ධයෙන් වූ අදාළ සටහන "උප්පැන්නය නැවත ලියාපදිංචි කරන ලදී" යන වචනවලට අතිරේකව පහත සඳහන් විස්තර ඒ ලේඛනයේ තීරයෙහි (රතු තීන්තෙන්) සලකුණු කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සලස්වනු ලැබිය යුතුය :—

(අ) උප්පැන්නය නැවත ලියාපදිංචි කරනු ලැබූ කොට්ඨාශය,

(ආ) උප්පැන්නය නැවත ලියාපදිංචි කිරීමේ සටහනෙහි දිනය සහ අංකය.

ඒ විස්තර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් හෝ සැබෑ බවට සහතික කරනු ලැබිය යුතුය.

## උපලේඛනය

"අ" ආකෘතිය

ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතේ 10 (5) (අ) වන වගන්තිය

### දරුකමට හදාගත් ළමයාගේ නම/* දරුකමට හදා ගැනීම කරන්නාගේ හෝ කරන්නන්ගේ නම හෝ නම් වෙනස් කිරීම සඳහා ඉල්ලීම

(දරුකමට හදාගත් ළමයාගේ වයස අවුරුදු 21 ට වැඩි නම්, ඔහු විසින් හෝ ඒ ළමයා දරුකමට හදා ගැනීම කරන්නා හෝ දරුකමට හදා ගැනීම කරන්නන් විසින් මේ ඉල්ලීම කරනු ලැබිය හැකිය.)

............................පදිංචි* දරුකමට හදාගත් ළමයා/* දරුකමට හදා ගැනීම කරන්නා හෝ දරුකමට හදා ගැනීම කරන්නන් වන සහ ..........................................වන දින හා අංක ..........................දරන දරුකමට හදා ගැනීමේ ලේඛනයේ සටහනෙහි (එහි පිටපතක් මීට අමුණා ඇත.) සඳහන්..........................වන මම/*අපි 3/* 5 යන කොටුවල දක්වා ඇති විස්තර පසුව පහත සඳහන් පරිදි වෙනස් කර ඇති බව මෙයින් ප්‍රකාශ කරමි./*කරමු.

3 වන කොටුව :..............................

5 වන කොටුව : (අ)..............................

(ආ)..............................

ඉහත සඳහන් පරිදි සටහන වෙනස් කරන ලෙස මම/*අපි මෙයින් ඉල්ලා සිටිමි./*සිටිමු.

..............................................................

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :..............................

### රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරන ලද නියමය

වෙනස් කිරීමට බලය දෙන ලදී/* නොදෙන ලදී.

රෙජිස්ට්‍රාර් ජනරාල්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,

19......ක්වූ...........මස......වන දින,
කොළඹ දී ය.

*අදාළ නොවන වචන කපා හරින්න.

"ආ" ආකෘතිය

ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතේ 10 (5) (ආ) වන වගන්තිය

### දරුකමට හදා ගැනීමේ ලේඛනයෙහි සටහනක යම් විස්තරවල ඇති යම් දෝෂයක් නිවරද කිරීම පිණිස වූ ප්‍රකාශනය

(දරුකමට හදාගත් ළමයාගේ වයස අවුරුදු 21 වැඩි නම් ඔහු විසින් හෝ ඒ ළමයා දරුකමට හදා ගැනීම කරන්නා හෝ දරුකමට හදා ගැනීම කරන්නන් විසින් මේ ඉල්ලීම කරනු ලැබිය හැකිය.)

.................................................................................................................................... පදිංචි දරුකමට හදාගත් ළමයා/දරුකමට හදා ගැනීම කරන්නා හෝ දරුකමට හදාගැනීම කරන්නන් වන සහ.................. වන දින හා අංක ........................දරන දරුකමට හදා ගැනීමේ ලේඛනයේ සටහනෙහි (එහි පිටපතක් මීට අමුණා ඇත.) සඳහන්..........................................වන මම/අපි 1 වන කොටුවෙහි විස්තර කරන ලද දරුකමට හදාගැනීමේ ලේඛනයේ සටහනෙහි ඇති පහත සඳහන් විස්තර වැරදි ලෙස වාර්තා කර ඇති බව මෙයින් ප්‍රකාශ කරන අතර 5 වන

කොටුවෙහි ප්‍රකාශ කර ඇති විස්තර *ඇතුළත් කරන ලෙස/*වෙනස් කරන ලෙස/*අත් හරින ලෙස මෙයින් ඉල්ලා සිටිමි./සිටිමු.

(1) දරුකමට හදා ගැනීමේ ලේඛනයෙහි සටහන පිළිබඳ විස්තර :

(I) සටහනෙහි අංකය : ........................

(II) සටහනෙහි දිනය : ........................

(2) ප්‍රකාශනය කරනු ලබන්නේ වෙනස් කිරීම/ඇතුළත් කිරීම/අත්හැරීම සඳහා ද යන වග

........................................

(3) වෙනස් කිරීම/ඇතුළත් කිරීම/අත්හැරීම අපේක්ෂාකරන දරුකමට හදා ගැනීමේ ලේඛනයෙහි කොටුවෙහි අංකය/කොටුවල අංක

........................................

(4) ඉහත 3 වන කරුණෙහි සඳහන් එක් එක් කොටුවෙහි වාර්තා කර ඇති විස්තර

........................................

(5) ඉහත 3 වන කරුණෙහි සඳහන් එක් එක් කොටුවෙන් අපේක්ෂා කරන වෙනස් කිරීම/ඇතුළත්කිරීම/අත්හැරීම පිළිබඳ ස්වභාවය

........................................

............................

ප්‍රකාශකයාගේ අත්සන.

ස්ථානය :........................................

දිනය :........................................

........................................

ප්‍රකාශක විසින් ප්‍රකාශනය කරනු ලබන්නේ කවර තත්ත්වයෙන් ද යන වග.

19..............ක් වූ ........................මස........................වන දින වූ මෙදින........................දී මා ඉදිරියෙහි ප්‍රකාශ කරන ලදී.

රෙජිස්ට්‍රාර් ජනරාල්/සහකාර
රෙජිස්ට්‍රාර් ජනරාල් ........................................
දිස්ත්‍රික්කයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ සාම විනිශ්චයකාර.

**රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරන ලද නියමය**

ඇතුළත් කිරීම/වෙනස් කිරීම/අත් හැරීම සඳහා බලය දෙන ලදී./නොදෙන ලදී.

........................................

රෙජිස්ට්‍රාර් ජනරාල්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්.

**19.........ක්වූ..............................මස.........වන දින,**
**කොළඹ දී ය.**

***අදාළ නොවන වචන කපාහරින්න.**

‘ඇ’ ආකෘතිය

ළමයින් දරුකමට හදාගැනීමේ ආඥා පනතේ 10ආ (1) වන වගන්තිය

දරුකමට හදාගත් ළමයකුගේ උප්පැන්නය නැවත ලියාපදිංචි කිරීම පිණිස වූ ප්‍රකාශනය

........................................................................................පදිංචි ........................
..............................................................................සහ ........................................
වන අපට ..................................................................................නමැති සහ........................
වන දින හා අංක ........................................දරන දරුකමට හදාගැනීමේ ලේඛනයේ සටහනෙහි සඳහන් ළමයා දරුකමට හදාගැනීමට අවසර දෙනු ලැබූ බව අපි මෙයින් ප්‍රකාශ කර සිටිමු. එම ළමයාගේ උප්පැන්නය

නැවත ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන අතර, පහත දක්වා ඇති විස්තර ඇතුලත් කිරීමෙන් ඒ ළමයාගේ උප්පැන්නය නැවත ලියා පදිංචි කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමු :—

1. උත්පත්තිය සිදුවූ දිනය හා ස්ථානය1 :

ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය සහ දිස්ත්‍රික්කය :

2. නම

3. ස්ත්‍රී පුරුෂ භාවය

4. පියාගේ
- සම්පූර්ණ නම
- උපන් දිනය
- උපන් ස්ථානය
- ජාතිය2
- තත්ත්වය හෝ වෘත්තිය

5. මවගේ
- සම්පූර්ණ නම
- උපන් දිනය
- උපන් ස්ථානය
- ජාතිය 2
- පදිංචි ස්ථානය*
- වයස*

6. මව්පියන් විවාහක ද ?*

7. මුත්තා ලංකාවේ උපන්නේ නම්
- —ඔහුගේ සම්පූර්ණ නම
- —ඔහු උපන් වර්ෂය
- —ඔහු උපන් ස්ථානය

8. පියා ලංකාවේ නො ඉපද මීමුත්තා ලංකාවේ උපන්නේ නම් මීමුත්තාගේ
- —සම්පූර්ණ නම
- —උපන් වර්ෂය
- —උපන් ස්ථානය

9. ප්‍රකාශකයන්ගේ සම්පූර්ණ නම්, පදිංචි ස්ථානය සහ කවරකු වශයෙන් ආරංචි සපයන්නේ ද යන වග

රු. 5 මුද්දරය

ප්‍රකාශකරුවන්ගේ අත්සන් : 1. ..............................

2. ..............................

19..........ක්වූ ..............................මස ............වන දින..............................................මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..............................................

රෙජිස්ට්‍රාර් ජනරාල්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්/ යාම විනිශ්චයකාරවරයා.

## නියමය

මෙම ප්‍රකාශ පත්‍රයේ සඳහන් වෙන උප්පැන්නය ලියාපදිංචි කරන ලෙස.............................................. දිස්ත්‍රික්කයේ............................................................කොට්ඨාශයේ උප්පැන්න ලේකම් වෙත මෙයින් නියම කරමි.

..........................................................

සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය, කොළඹ 1,
19..................ක්වූ ........................මස............වන දින දීය.

සටහනෙහි අංකය හා දිනය (ලේකම් විසින් පිරවිය යුතුය) ..............................................................

---

*මේ තීරුවල ඇතුළත් කරනු ලබන විස්තර උත්පත්තිය සිදුවූ අවස්ථාවේදී පැවති තත්ත්වය අනුව විය යුතුය.

1. මාසය ද අවුරුද්දේ අවසාන කොටසද, අකුරු වලින් යොද දින පිළිබඳ සියලු විස්තර මෙහි මේ පිළිවෙලට සඳහන් කරනු—1953 (පනස්තුනේ) ජනවාරි පළමුවෙනි දින.

2. දෙමළ හෝ මරක්කල ජාතීන් විස්තර කිරීමේදී ''ලාංකික දෙමළ'' නැතහොත් ''ලාංකික මරක්කල'' කියා හෝ ''ඉන්දියානු දෙමළ'' නැතහොත් ''ඉන්දියානු මරක්කල'' කියා හෝ අවශ්‍ය පරිදි යොදනු.

සටහන. :

1. ආකෘතිය, ප්‍රකාශකරුවන්ගේ විවාහ සහතිකයක් සමග යැවිය යුතුය.

2. ප්‍රකාශනයෙහි රුපියල් පහක මුද්දර ඇලවිය යුතු අතර ඒ මුද්දර ප්‍රකාශකයින් විසින් අවලංගු කරනු ලැබිය යුතුය.

4–832

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී